# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

අංක 14,480 — 1965 අගෝස්තු 13 වැනි සිකුරාදා — 1965.8.13

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී)

## II වැනි කොටස — අධිකරණ

(වෙන වෙනම ගොනුකරගත හැකි පරිදි සෑම කොටසකටම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)



| | පිට | | පිට |
|---|---|---|---|
| සම්මත වූ පනත් ... ... ... | — | පිස්කල් විකිණීම් පිළිබඳ දැන්වීම් ... ... | 97 |
| ශ්‍රේෂ්ඨාධිකරණයේ දැන්වීම් ... ... ... | — | මුදල් නඩු පිළිබඳ දැන්වීම් ... ... ... | — |
| ශ්‍රේෂ්ඨාධිකරණයේ අපරාධ නඩු සැසි පිළිබඳ නිවේදන ... | — | නීති අධ්‍යාපන සභාවේ දැන්වීම් ... ... ... | — |
| දිස්ත්‍රික් උසාවිවල හා ඊට පහළ උසාවිවල දැන්වීම් ... | 97 | නොතාරිස් ලැයිස්තුව ... ... ... | — |
| වස්තු භංගත්ව නඩු පිළිබඳ දැන්වීම් ... ... | — | විවිධ දැන්වීම් ... ... ... | — |
| පිස්කල් මාර්ෂල්වරුන් පත්කිරීම් ... ... | — | | |



## දිස්ත්‍රික් උසාවිවල හා ඊට පහළ උසාවිවල දැන්වීම්

### නිවේදනයයි

**මීගමුව ඉල්ලීම් උසාවියේ දීය**

(479 වැනි අධිකාරය වන) වටිනාකමක් නැති ලේඛන විනාශකර දැමීමේ ආඥාපනත යටතේ, මෙම උසාවියේ පවරන ලද පහත සඳහන් අංක දරන නඩු, මෙම නිවේදනයේ දින සිට තුන් මසක් ඇතුළතදී ලිඛිත විරුද්ධතාවයක් ඉදිරිපත් නොකළහොත්, එම කාලය අවසානයේදී එම නඩුපොත් විනාශ කරන බව මෙයින් නිවේදනය කරනු ලැබේ :—

මීගමුව ඉල්ලීම් උසාවියේ 1930.7.8 දින පවරන ලද නඩු අංක 37,250 සිට 1959.8.18 දින පවරන ලද නඩු අංක 49,999 දක්වා.

ඩී. ඊ. ධර්මසේකර,
ඉල්ලීම් කොමසාරිස් මීගමුව.

1965 ජූලි 30.

8-272/1

---

### නිවේදනයයි

**මීගමුව මහෙස්ත්‍රාත් උසාවියේ දීය**

(479 වැනි අධිකාරය වන) වටිනාකමක් නැති ලේඛන විනාශකර දැමීමේ ආඥාපනත යටතේ, මෙම උසාවියේ පවරන ලද පහත සඳහන් අංක දරන නඩු, මෙම නිවේදනයේ දින සිට තුන් මසක් ඇතුළතදී ලිඛිත විරුද්ධතාවයක් ඉදිරිපත් නොකළහොත්, එම කාලය අවසානයේදී එම නඩුපොත් විනාශ කරන බව මෙයින් නිවේදනය කරනු ලැබේ :—

මීගමුව මහෙස්ත්‍රාත් උසාවියේ 1943.7.20 දින පවරන ලද නඩු අංක 39,000 සිට 1960.2.13 දින පවරන ලද නඩු අංක 99,999 දක්වා.

ඩී. ඊ. ධර්මසේකර,
මීගමුව මහෙස්ත්‍රාත්.

1965 ජූලි 30.

8-272/2

---

### නිවේදනයයි

**මීගමුව නාගරික මහෙස්ත්‍රාත් උසාවියේ දීය**

(479 වැනි අධිකාරය වන) වටිනාකමක් නැති ලේඛන විනාශකර දැමීමේ ආඥාපනත යටතේ, මෙම උසාවියේ පවරන ලද පහත සඳහන් අංක දරන නඩු, මෙම නිවේදනයේ දින සිට තුන් මසක් ඇතුළතදී ලිඛිත විරුද්ධතාවයක් ඉදිරිපත් නොකළහොත්, එම කාලය අවසානයේදී එම නඩුපොත් විනාශ කරන බව මෙයින් නිවේදනය කරනු ලැබේ :—

මීගමුව නාගරික මහෙස්ත්‍රාත් උසාවියේ 1950.1.4 දින පවරන ලද නඩු අංක 1 සිට 1960.6.30 දින පවරන ලද නඩු අංක 11,661 දක්වා.

ඩී. ඊ. ධර්මසේකර,
මීගමුව නාගරික මහෙස්ත්‍රාත්.

1965 ජූලි 30.

8-272/3

---

## පිස්කල් විකිණීම් පිළිබඳ දැන්වීම්

### මධ්‍යම පළාත

**මහනුවර දිස්ත්‍රික් උසාවියේ දීය**

අම්පිටියේ අංක 366 පදිංචි ඇස්. සමරසේකර ......... පැමිණිලිකාරයා.
නොම්මරය ඇම්.ඇස්. 7551. එදිරිව
මහනුවර පේරාදෙනිය පාරේ අංක 853 හි පදිංචි කේ. පොන්වීර මහත්මිය හා ඩී. ජේ. ඩී. පොන්වීර.............විත්තිකාරයන්.

මෙහි පහත සඳහන්වෙන දේපලවලින් ඉහත කී නඩුවේ විත්තිකාරයින්ට තිබෙන අයිතිවාසිකම සහ ප්‍රයෝජනයත් වර්ෂ 1965 ක්වූ සැප්තැම්බර් මස 8 දින උදේ 11 පැයට එකී ස්ථානයේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණන්ට යෙදෙන බව මෙයින් දන්වනු ලැබේ. රුපියල් 1,722.45ක් හා අනෙකුත් මුදල ඇතුළු පවුන්ඩේජ් මුදල් ආදිය අය කර ගැනීම සඳහායි. එනම් :—

මධ්‍යම දිශාවේ මහනුවර දිස්ත්‍රික්කයේ මහනුවර නගර සභා සීමාව තුල ගැටඹේ පිහිටා තිබෙන වරිපනම් අංක 400 දරණ වෙල් අවේ කෝපිවත්ත නමැති ඉඩමෙන් සී. ජී. ක්‍රෙල් විෂිම් මිනින්දෝරු තැන සාදා ඇති 1930 ඔක්තෝබර් මස 28 දින සහ අංක 42/80 දරණ ප්ලෑනේ ලොට් 3 වශයෙන් දක්වා ඇති රූඩ් තුනයි පර්චස් හතරයි දශම පහක් ඇති කොටසට මායිම් :—උතුරට මහපාර, දකුණට දුම්රියට වෙන්කර ඇති කොටස, නැගෙනහිරට ජෝර්ජ් ලැම්බර්ට්ට ඇති ලොට් 2 දරණ කොටස සහ බස්නාහිරට එච්. ජේ. ඇම්. පෙරේරාට ඇති ලොට් 4 දරණ කොටස සහ එහි තුල ඇති ගොඩනැගිලි ගහකොල පලතුරු ආදියෙන් නොබෙදු (8/14) දහ හතරෙන් අට පංගුවක් වේ.

(ඉහත සඳහන් මුදලින් විත්තිකරුවන් විසින් ගෙවා ඇති මුදල් අඩුවිය යුතුව ඇත.)

ර. මු. ජ. රත්නායක,
ම. ප. පිස්කල් වෙනුවට.

1965 ක්වූ අගෝස්තු මස 4 වැනි දින,
මහනුවර පිස්කල් කාර්යාලයේ දීය.
8-365

## ඌව පළාත

### බදුල්ලේ දිස්ත්‍රික් උසාවියේ දීය

බණ්ඩාරවෙල කෙලින් වීදියේ පදිංචි වීරවර්න තිලවීර රම්පත බන්ඩිගේ දාවිත් සිංඤෝ ........................ පැමිණිලිකාරයා.

නොම්මරය 1604/ඇම්. එදිරිව

බණ්ඩාරවෙල ගෝනාමොටාවේ කුඩාගොඩ ගෙදර පදිංචි ඒ. ඇම්. උක්කු බණ්ඩා ........................................ විත්තිකාරයා.

මෙහි පහත සඳහන් වෙන දේපලවලින් ඉහතකී නඩුවේ විත්තිකාරයාට තිබෙන අයිතිවාසිකම සහ ප්‍රයෝජනයත් වර්ෂ 1965 ක්වූ සැප්තැම්බර් මස 6 දින පෙරවරු 11 පැයට එම ඉඩමේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණන්ට යෙදෙන බව මෙයින් දන්වනු ලැබේ. එනම්, රුපියල් 475 ක් අයකර ගැනීම පිණිසයි.

ඌව පළාතේ බදුල්ල දිස්ත්‍රික්කයේ මහපළාත කෝරළේ ඕබොඩැල්ලේ ගම තිබෙන කුඩාගොඩ නොහොත් කුඩවයා පතන අක්කරයක් වපසරිය ඇති ඉඩමට මායිම්: උතුරට, කහත්තේවෙල ඔය දිගට ඇති රිෂිවේසම නැගෙනහිරටත් කහත්තේවෙල ඔය දිගට ඇති රිෂිවේසම, දකුණට, ලොට් 11 සහ 5 බස්නාහිරට, පාර දිගට ඇති රිෂිවේසම මෙකී සතර මායිම්තුළ ඉඩම සහ වකරන් සෙවිලි කරන ලද ගොඩනැගිල්ලක් සමග වේ.

වර්ෂ 1965 ජූලි 30 වැනි දින බදුල්ලේ පිස්කල් කන්තෝරුවේ දී ය.

විල්ප්‍රඩ්. ඒ. සෙනරත්,
ඌව පලාතේ අතිරේක නියෝජ්‍ය පිස්කල්.

8-396

සෑම සිකුරාදා දිනයකම ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය පළ කරනු ලැබේ. ප්‍රසිද්ධ නිවාඩු දින අතරට පැමිණෙන සෑම සතියකදීම පළ කරන දිනය වෙනස් වීමට ඉඩ තිබේ.

ගැසට් පත්‍රය පළ කරන දින සිට කාර්යාලය වැඩ කරන දින හතරකට ප්‍රථම පස්වරු 3.30 ට සියළුම දැන්වීම් සහ ප්‍රකාශනයන් කොළඹ, රජයේ මුද්‍රණාලයේ මුද්‍රණාලයාධිපති තැනට ලැබෙන සේ එවිය යුතුයි (සාමාන්‍ය වශයෙන් සඳුදා පස්වරු 3.30 ට ප්‍රථමයෙන්).

ගැසට් පත්‍රය ලබාගැනීම සඳහා දයක මුදල් කොළඹ, මහලේකම් කාර්යාල ගොඩනැගිල්ලේ පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත කෙලින්ම යැවිය යුතුය. ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති විසින් දයක මුදල් භාරගනු නොලැබේ.

ලංකාවේ වැලව්වේනයෙහි පිහිටි "ඊස්ටර්න් පේපර් මිල්ස් කෝපරේෂන්"හි නිපදවන ලද කඩදාසිවල ආණ්ඩුවේ නියමයෙන් ලංකාණ්ඩුවේ මුද්‍රණාලයේ මුද්‍රාපිතයි